www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සුලි සුලං විපත: එක්සත් ජනපද ධනවාදය අවමානයට පත් වෙයි

## The hurricane disaster: US capitalism stands disgraced

**ලෝක සමාජවාදී වෙබ් අඩවි කර්තෘ මන්ඩලයේ ප්‍රකාශය**
**2005 සැප්තැම්බර් 02**

නිව් ඕලියන්ස් හා මිසිසිපි ගල්ෆ් වෙරල තීරයේ දිග හැරෙමින් තිබෙන ව්‍යසනය එක්සත් ජනපද ඉතිහාසයේ නුවූ විරූ ජාතික අවමානයක් බවට පරිවර්තනය වී ඇත.

දැන් සුන්බුන් ගොඩක්ව පවතින කලෙක නිව් ඕලියන්ස් නගරය උග්‍ර මානුෂික වද වේදනාවේ ද බලාපොරොත්තු රහිත බවේ ද දිලිඳුකමේ හා නොසැලකිල්ලේ දර්ශනය සමස්ත ලෝකයේ ම හා වඩාත් ප්‍රමුඛව ඇමරිකාවේ ම විස්මයෙන් සිහිසුන් වූ මිනිසුන්ගේ දෑස් හමුවේ ඇමරිකානු ධනවාදයේ කුනුවී ගිය අභ්‍යන්තරය එලිදරව් කර තිබේ.

ඇමරිකාව ''ලෝකයේ ශ්‍රේෂ්ඨතම රට'' ය යන ප්‍රතිගාමී මිථ්‍යාව කැබලි වී යන පහරක් ඊට වැදී තිබේ.

කැත්‍රීනා සුලිසුලඟ අද්‍යතන ඇමරිකාව පිලිබඳව ඇඟ කිලිපොලායන සත්‍යයන් එලිමහනට ගෙනැවිත් ඇත. එනම්, එය තියුනු පන්ති බෙදීම්වලින් ඉරී ගිය, සමාජයථාර්ථය පිලිබඳව හෝ මහජන වගකීම් පිලිබඳව හෝ කිසිදු සංවේදී බවක් නොදක්වන දූෂිත ඉසුරුමතුන් විසින් පාලනය වන, කවර ආකාරයක හෝ විපතක් ඇතිවූ විටෙක බිල්ලට යාමට නියමිත වූ කිසිදු සමාජ ආරක්ෂන ජාලයක් හෝ පොදු ආධාර වැඩපිලිවෙලක් අහිමි වූ ද පුරවැසියන්ගෙන් යුක්ත වූ රටකි.

මෙම මානව ඛේදවාචකයට වොෂින්ටනය දැක් වූ ප්‍රතිචාරය වූයේ සම්පූර්න අපරිනත භාවය සහ සාපරාධී නොකතා හැරීම ය. සිව් දිනක් ගතවන තෙක් ඇමරිකාවේ ප්‍රධාන නගරයක වීදිවල මහජනයා කිසිදු හව්හරනයක් නොමැතිව වචනාර්ථයෙන්ම මියයාමට හැර දමා තිබුනි. ඉතාමත් ම දිලිඳු තුන්වන ලෝකයේ රටවල තත්වයන් හා ගැලපෙන්නා වූ දුක්වේදනාවේ ද අවමානයේ ද රූපරාමු දිනපතා ම විකාශය වුවද ලෝකයේ ධනයෙන් විශාලතම කොටස ගොඩ ගසාගෙන තිබෙන රටක ආන්ඩුවෙන් කිසිදු ප්‍රතිචාරයක් පෙනෙන්නට නොතිබුනු ගානය.

නිව් ඕලියන්ස්හි ජල ගැලීම් බාධක බැමි බිඳ දැමූ කුනාටුව වසර 25ක අඛන්ඩ සමාජ හා දේශපාලන ප්‍රතිගාමිත්වයේ බිහිසුනු පලවිපාකද එලිමහනට ගෙන ආවේ ය. අත්‍යවශ්‍ය සමාජ සේවාවන් විනාශ කිරීමේ ද දිලිඳුබව පිටුදැකීමේ සහ ආපදා කලමනාකරනයේ කටයුතු බාර ආන්ඩුවේ ආයතනය බිඳ විසුරුවා ලීමේ ද සැබෑ විපාක සහ ''නිදහස් වෙලඳපොල'' විශ්මිත ලෙස නූතන සමාජයේ ගැටලු විසඳා ලීම පිලිබඳව තොරතෝංචියක් නැති ගොඩ වෙදුන්ගේ කථා දශ ලක්ෂ ගනන් මිනිසුන් ඉදිරියේ එලිදරව් කලේ ය.

විදුලිය ජලය හෝ ආහාර පාන නොමැතිව, වසංගත පැතිරීමේ සහ මරනයේ තර්ජනයට ලක්ව අඩු තරමේ ලක්ෂයක් ජනයා නගරයේ කොටු වී සිටිය දී සැපයුම් සංවිධානයේ අතිමූලික සැකිල්ලක් සම්පාදනය කිරීමට පවා ආන්ඩුව අපොහොසත් වූ බව ඔප්පු කර පෙන්වී ය. ව්‍යසනයෙන් විපතට පත්ව සිටි දහස් ගනනකට මූලික වෛද්‍ය පහසුකම් සැපයීමේ තත්වය පසෙක තිබිය දී බරපතල ලෙස රෝගී වූ අය රජයේ රෝහල්වලින් ඉවත් කර ගැනීමට පවා ආන්ඩුව අපොහොසත් විය.

නිව් ඕලියන්ස් ප්‍රදේශය තර්ජනයට ලක් කල ස්වාභාවික ව්‍යසනයට ආන්ඩුව දැක් වූ ප්‍රතිචාරය කුමක් ද? ආන්ඩුව සිටියේ කුනාටුව වෙනත් අතකට ගමන් කරනු ඇතැයි ඔට්ටු ඇල්ලීමේ සහ අනතුරුව ''තමන්ගේ අවශ්‍යතා තමන් විසින් ම බලා ගතයුතු ය'' යන වර්ගයේ පිලිවෙතක ය. නගරවාසීන්ට ඉවත් වන ලෙස දැනුම් දුන් අතර, ප්‍රවාහන පහසුකම් අහිමි හෝ ඒ සඳහා වත්කමක් නුවූ දස දහස් ගනනක් ඔවුන්ගේ ඉරනමට අතහැර දමන ලදි.

වීදිවල මල කඳන් ගොඩ ගැසෙද්දී දහස් ගනන් වූ කුසගින්නට පත් සහ නිවාස අහිමි වූ ජනයා ''අපට උදව් ඕනෑ'' කෑගැසීමේ මට්ටමට ඇද හෙලා තිබේ. මූලික ගලවා ගැනීමේ ක්‍රියාන්විතයක් ඇති කිරීමට හෝ සම්බන්ධීකරනයට වොෂින්ටනය අසමත් වීම නිසා දැනටමත් දහස් ගනනක් යයි ගනන් බලා ඇති මිය ගියවුන් සංඛ්‍යාව නිසැකව ම තවත් ඉහල යනු ඇත.

මානව වධ වේදනා පිලිබඳව ආන්ඩුවේ කැත නොතකා හැරීම ද, මෙම ව්‍යසනය සඳහා සූදානම් වීමට අසමත් වීම ද එහි නොසැලකිල්ල සහ සියල්ලටමත් වඩා ඔවුන්ගේ අපරිනත බව ද ඔවුන්ගේ යටහත් පහත් ඇමරිකානු මාධ්‍යවලට පවා දරා ගැනීමට අපහසු විය. අර්බුදයට මුහුනපෑම සඳහා රට එක්සත්ව කටයුතු කිරීමේ වඳ දේශප්‍රේමී ඉල්ලීම් සමග ආහාර හෝ ජලය නොමැතිව දුකට පත් ජනතාව ''කොල්ලකෑමේ'' අපවාදයකට ලක් කිරීමට දැරූ උත්සාහය විනාශය කෙරේ දැක් වූ නිල ප්‍රතිචාරය ප්‍රතික්ෂේප කල නොහැකි මහත් විත්නැහියකට මුහුනපෑමේ තතු යටතේ ඇදගෙන වැටුනි.

ව්‍යසනයට පත් ප්‍රදේශවලට පිටත් කල වාර්තාකරුවෝ උදව් ඉල්ලා කෑගැසීමට කිසි ප්‍රතිචාරයක් නොලැබ සිටින ජනතාව දැක කඳුලු සැලූහ. අසරනවූ රූපවාහිනී නිවේදකයන් ජනතාව මුහුන දී ඇති මෙවන් දුක් වේදනාවන්ට පිහිට වීමට බලධාරීන් කාලකන්නි ලෙස අපොහොසත් වූයේ මන්දැයි විමතියෙන් හඬ නැගූහ.

ජනාධිපති, කොංග්‍රසය සහ රිපබ්ලිකන් හා ඩිමොක්‍රැටික් පක්ෂ දෙක ද ඇතුලු සියල්ලන්ම කැබලි වී ගිය ජීවිත ද සමගින් බියකරු සහ අවිනිශ්චිත අනාගතයකට මුහුන දෙන්නා වූ ලක්ෂ ගනන් ජනතාව නො ඇදහියහැකි පරිද්දෙන් නොතකා හල හ. කැත්‍රිනාවේ ආර්ථික පසු කම්පනයන්ට ඉදිරියේ දී මුහුනපෑමට නියමිත කෝටි ගනන් ජනතාව ගැන කවර කතාද?

ජෝජ් ඩබ්ලිව්. බුෂ් ලෙස පුද්ගලාරෝපිත ජනාධිපති තුලින් ප්‍රතිබිම්බනය වන්නේ අපරිනත හා අමානුෂික අංගලක්ෂනයෙන් හෙබි මුදලේ උමතුවෙන් පෙලෙන අභ්‍යන්තරයෙන් ම ජුගුප්සාජනක වූ මූල්‍ය ප්‍රභූ පැලැන්තිය යි.

සති දෙකක් තිස්සේ කැරිබියානු මුහුදු ප්‍රදේශයේ වර්ධනය වූ කුනාටුව නිව් ඕලියන්ස් සහ මිසිසිපි වෙරල දෙසට සෙමෙන් ලඟා වෙද්දී බුෂ් ටෙක්සාස්වල සිය කිරෝෆෝඩ් සත්ව ගොවිපලේ සතුටු වෙමින් සිටියේ ය. ඔහුගේ පරිපාලනය ලඟාවෙමින් තුබු කුනාටුවෙන් මතුව තිබූ අන්තරායන්ට මුහුන පෑම පිනිස කිසිදු බැරෑරුම් සූදානම්වීමක් නො කල බව දැන් පැහැදිලි ය.

බ්‍රහස්පතින්දා ''ගුඩ් මෝනිං ඇමරිකා'' රූපවාහිනී වැඩ සටහනට පෙනී සිටිමින් බුෂ් කොල්ලකරුවන් ''කිසිසේත් ම නො ඉවසන'' බවට කල තුච්ඡ ප්‍රකාශනය ද එකතු කර ගනිමින් කලින් දිනයේ ඔහුගේ කාලකන්නි හැසිරීම යලිත් වරක් රඟ දැක්වී ය.

''ඒබීසී'' රූපවාහිනී වැඩ සටහන මෙහෙයවූ ඩයනා සෝයර්, පසු ගිය සය මස තුල ප්‍රධාන තෙල් සමාගම් තෙල් මිල ඉහල යෑමෙන් නිකම්ම අත් කර ගත් දැවැන්ත ලාභයෙන් කොටසක් ආපදා සහන කටයුතු අරමුදලට යොදන ලෙසට බල කල යුතු යයි මතු වී ඇති අදහස පිලිබඳව විමසූ විට ජනාධිපති සුදුමැලි විය. ඔහු පුන්‍ය ආයතන වෙත ''මුදල් යවන'' ලෙස ඇමරිකානු ජනතාවට උපදේශනාත්මකව දැනුම් දුන්නේ ය. වෙනත් වචනවලින් කිවහොත් දිවි රැක ගැනීමට, දුබලයන්ට හා රෝගීන්ට සාත්තු කිරීමට හා අවතැන්වූ සහ අසරන වූ අයට යලි ජීවිත ගොඩ නගා ගැනීම පිනිස උදව් වීමට ආන්ඩුවේ පැත්තෙන් සැලකිය යුතු මූල්‍ය දායකත්වයක් නො සැපයෙනු ඇත. එසේ ම, රටේ වැදගත්ම නගරයන්ගෙන් එකක් වූ නිව් ඕලියන්ස් යලි ගොඩ නැංවීමට කිසිදු ජාතික මට්ටමේ මධ්‍ය රජයෙන් මූල්‍ය සම්පාදනයක් හා සංවිධානාත්මක සැලැස්මක් සැපයෙනු නැත. එය ඇමරිකානු ජනතාවගේ සංගීතමය හා කලාත්මක අංශවල සමහර තීරනාත්මක සංස්කෘතික ජයග්‍රහනයන් සංකේන්ද්‍රනය කර ගත් නගරයන් වෙනුවෙන් සියල්ලටම වඩා දසලක්ෂ ගනනකගේ දුක් කම්කටොලු වෙනුවෙන් ආන්ඩුව විසින් ආරක්ෂා කරනු ලබන ප්‍රකෝටිපති ප්‍රභූ පැලැන්තියේ ලාභ උවමනාවන්ට පහර වැදීමට ඉඩ දිය නොහැක.

එදින අපරභාගයේ දී ගංවතුරේ පල විපාකය ''තාවකාලික දුෂ්කරතාවක්'' ලෙස බුෂ් විසින් ගෙන හැර දැක් වී ය. නිව් ඕලියන්ස්හි දුප්පත් හා කම්කරු පන්තික සාමාන්‍ය ජනතාව කෙරෙහි බලධාරින්ගේ නිර්දය ආකල්පය රිපබ්ලිකානු කථානායක ඩෙනිස් හැස්ටර්ට් විසින් බ්‍රහස්පතින්දා සම්පින්ඩනය කලේ මෙසේ ය. ''නිව් ඕලියන්ස් නගරය යලි ගොඩ නැංවීමට බදු වසයෙන් රැස් කරන ඩොලර් වැය කිරීම අර්ථ විරහිත ය. එම ස්ථානයේ බොහෝ තැන් බුල්ඩෝසර් කල හැකි බව පෙනීයයි.''

හැස්ටර්ට් ගේ මෙම ඇඟ කිලිපොලා යන ප්‍රකාශ පසුව ඉවත් කර ගැනීමට සිදු වුව ද එහි නිශ්චිත දේශපාලන තර්කනයක් තිබේ. කැත්‍රිනා සුලි සුලඟින් වනසා දැමුනු ජීවිත යලි ගොඩ නැගීම පිනිස ප්‍රධාන පක්ෂ දෙක විසින් ම දශක ගනනාවක් පුරා ගෙන ගිය පෞද්ගලීකරනය සහ ධනවතුන් වෙත සම්පත් මාරු කිරීම මත පදනම් වූ ජාතික පිලිවෙතක සමස්ත තල්ලුවට ම හරස්කපන්නා වූ දැවැන්ත පරිශ්‍රමයක් ආන්ඩුව විසින් දියත් කිරීම අවශ්‍යකෙරේ.

වර්තමාන පරිපාලනයද කොන්ග්‍රසය තුල ඔවුන්ගේ ඩිමොක්‍රැටික් සහකරුවන් ද විසින් අඩු වියදම් නිවාස, පාසල් ඉදි කිරීමටත් විනාශයෙන් විරැකියාවට පත් ලක්ෂ ගනනකට රැකියා සැපයීම සඳහා බැරෑරුම් සැලැස්මක් දියත් කරතැයි කිසිවකුටත් සත්‍ය වසයෙන් විශ්වාස කල හැකි ද?

දකුනේ විනාශය පිලිබඳව කොන්ග්‍රසය මුලුමනින්ම්පාහේ නිහඬ ය. ධනපතියන් සඳහා දැවැන්ත බදු සහන, ඉරාකයේ සහ ඇෆ්ඝනිස්ථානයේ යුද්ධ සඳහා ද පෙන්ටගනයේ වියදම් සඳහා ද දැවැන්ත මුදල් සහ දේශීය ආරක්ෂක දෙපාර්තමේන්තුවට අරමුදල් ලෙස බිලියන ගනන් වෙන් කල බුෂ්ගේ ආන්තික දක්ෂිනාංශික න්‍යාය පත්‍රයට සහාය පලකොට ඡන්දය දුන් ඔවුනට කීමට දෙයක් නැත.

කැපිටෝල්හිල් හි දශලක්ෂපතින්ගේ සමාජශාලාව වන කොන්ග්‍රසය, ගල්ෆ් වෙරලබඩ කුනාටු හා ගංවතුර වැලැක් වීමේ යල් පැන ගිය නො සෑහෙන පද්ධතීන් නවීකරනය කිරීමේ අවශ්‍යතාවන් ගැන කර තිබූ නිර්දේශයන් ද ඇතුලත් මූලික යටිතල පහසුකම් සඳහා අරමුදල් කපා හැරීමට ඡන්දය දුන් බව හොඳින් ම දැන සිටිති.

සුපුරුදු ලෙස ම ඩිමොක්‍රැටික් පක්ෂය කිසිදු විරෝධයක් නො දැක් විය. හානියට පත් කලාපවල සැරිසරමින් පුන්‍යාධාර සඳහා අඬබෙර ගසමින් ද හිටපු ඩිමොක්‍රැටික් ජනාධිපති බිල් ක්ලින්ටන් හිටපු රිපබ්ලිකන් ජනාධිපති වූ දැන් ජනාධිපතිගේ පියා සමග එක්ව සිය වීදි නාට්‍යය යලි අරඹන බව ප්‍රකාශ කිරීමට හැකිවීම පිලිබඳව සැබැවින් ම ජනාධිපතිවරයා සිය කෘතඥතාව පල කලේ ය: මේ ආකාරයට ඩිමොක්‍රැටික් පක්ෂය විපතට පත්වූවන්ට උදව් වීමට ද විනාශයට පත් කලාප යලි ගොඩ නැංවීමට ද

බැරෑරුම් මූල්‍යමය දායකත්වයකට එරෙහි වන රිපබ්ලිකන් පිලිවෙත සහ ධවල මන්දිරය සමග සිය එකඟතාවය පල කලේ ය.

වර්තමාන බේදවාචකයේ තීරනාත්මක සංරචකයන් ස්වාභාවික ඒවා නොව සමාජමය හා දේශපාලනමය ඒවා වෙයි. පසු ගිය දශක තුන තිස්සේ ඇමරිකානු පාලක ප්‍රභුව ඊට පෙර කාලයේ දී පිහිටුවා තිබූ ආන්ඩුවේ පාලනයට සහ සමාජ සුභසාධනයට සම්බන්ධ සියලු ම ආයතන විසුරුවා හරිමින් සිටිය හ. වර්තමාන ව්‍යසනය මෙම සමාජ හා දේශපාලන පිරිහීමේ බිහිසුනු නිර්මානයකි.

දහනම වැනි සියවසේ සහ විසි වැනි සියවසේ මුල් භාගයේ මාරක ජල ගැලීම්වල සිට 1930 ගනන් වල දූවිලිබඳුන අවපාතය දක්වා වූ අතීත ස්වාභාවික සහ ආර්ථික ආපදාවන්ගෙන් උකහා ගත් පාඩම් ලාභ පද්ධතියේ අර්බුදයෙන් පොලඹවනු ලැබ සියලු සමාජ වගකීම් ලාභය සූරා කෑමටත් පෞද්ගලිකව ධනය ගොඩගසා ගැනීමට ත් කවර කලෙකටත් වඩා නිර්දය ලෙස යටත් කර දැමූ පාලක ප්‍රභුවක් විසින් ප්‍රතික්ෂේප කර සමච්චලයට ලක් කර තිබේ.

කපටි නුවනකින් ද ඔහුගේ පන්තියේ සාපේක්ෂකව දුර දක්නා නියෝජිතයකුවූ ෆ්රැන්ක්ලින් රූස්වෙල්ට් ට සමාජ විප්ලවයේ අනතුරින් ධනපති පද්ධතිය බේරා ගැනීමේ මූලික අරමුන සහිතව සමාජ ප්‍රතිසංස්කරන සැලැස්මක් පිටි පසින් ඇමරිකානු පාලක ප්‍රභුවට පයින් අනිමින් ද දෙස් දෙවොල් තබමින් ද ඇදගෙන යාමට සිදු විය. ඔහුගේ ජනාධිපති ධුර කාලයේ දී පවා ටෙනසි නිම්න අධිකාරිය වැනි ආන්ඩුවෙන් අරමුදල් සපයා පාලනය කල සමාජ සංවර්ධනයේ විශාල ව්‍යාපෘති දිලිඳු බව හෝ සමාජ අසමානතාවය හෝ තුරන් කිරීම සඳහා වන පලල් විධි විධානයන්ගේ ආදර්ශයක් බවට කිසි දිනෙක පත් නො වී ය. නිෂ්පාදන මාධ්‍යයන්හි පෞද්ගලික අයිතිය සහ ලාභය සඳහා නිෂ්පාදනය මත පදනම් වූ ආර්ථික පද්ධතියක ප්‍රතිවිරෝධතා සහ අවශ්‍යතා සඳහා වෙනත් ව්‍යාපෘතීන් අත් හැර දැමීමට සිදු විය.

1970 ගනන්වල සිට ඉදිරියට ඇමරිකානු ධනවාදයේ අර්බුදය ගැඹුරු වෙද්දී එක්සත් ජනපද පාලක ප්‍රභුව සමාජ ප්‍රතිසංස්කරන පිලිබඳ සමස්ත සංකල්පයටම පහර දී සංගතවල කටයුතු මත මීට පෙර පනවා තිබූ සීමා බන්ධන ඉවත් කර දැමී ය.

ප්‍රතිඵලය වූයේ සමාජය මුදුනෙහි පෙර නුවූ විරූ ලෙස ධනය එක්රැස් කරවමින් සහ සොර දෙටුවන්ගේ යුගයේ පැවති තත්වය ද ඉක්මවා යන සමාජ අසමානතාවක් ඇති කරවමින් සිදු වූ සමාජ මංකොල්ලයේ නොනවතින සන්තතියකි.

වංචාව, සමපේක්ෂනයේ නරකම රූපාකාරයන් සහ සාපරාධීත්වය ඇමරිකානු සමාජයේ ඉහලම තට්ටුවල හාත්පස පැතිර තිබේ. සමාජ ජීවිතයේ ඉතාම මූලික ආකෘතීන් කඩා වැටීමේ රූපයෙන් කුනාටුවක් මගින් ඇද හෙලනු ලැබ හදිසියේ ම එලි දැක්වුන යටින් පවතින යථාර්ථය මෙය යි.

දේශපාලන සංස්ථාපිතය ද ව්‍යාපාරික ප්‍රභූ පැලැන්තිය ද සමාජයේ සියලු ගැටලුවලට විසඳුම ධනවාදයේ අබාධිත සංවර්ධනය බව එක දිගටම ඔවුන් කියා සිටිදේ ද සමග ම බංකොලොත් බැව් එලිදරව් වීය.

කැත්‍රිනාව මුදා හල ව්‍යසනය මගින් නොවලහා හෙලිදරව් කලේ එක් ඇමරිකාවක් ඉසුරුමත් හා වරප්‍රසාදිත කොටස් සඳහා ද අනෙක සමාජ අගාධයේ ගැට්ටේ සිටින අති විශාල බහුතරයක් කම්කරුවන් ගෙන් සමන්විත වූ ද රටවල් දෙකක් බව ය.

ඉරාක යුද්ධය, ''ත්‍රස්තවාදයට එරෙහි භූගෝලීය යුද්ධය'' සහ ''නිජබිමේ ආරක්ෂාව'' පිලිබඳ උත්සුකය ඇමරිකානු ජනතාවගේ ආරක්ෂාව සඳහා අරමුනු කර ඇතැයි යන සියලුම ප්‍රකාශ මුසාවාද ලෙස එලිදරව් වී තිබේ. නිව් ඕලියන්ස් වැසියන් රැකගැනීමේදී දැක්වූ අන්ත නොහැකියාව ඇමරිකානු පාලක ප්‍රභුවේ සාපරාධීත්වය සහ ජනතාවගේ ඉතාම මූලික අවශ්‍යතාවන්ගෙන් ඉවතට සම්පත් ගලා යාමට සැලැස්වීමේ ක්‍රියාවලිය වසං කිරීම සඳහා ගෙනගිය ප්‍රචාරයන් පමනක් බව එලිදරව් කලේ ය.

නිව් ඕලියන්ස්හි ප්‍රධාන පාඩම නම් ජන සමාජයේ මූලික අවශ්‍යතාවන් මූල්‍ය කතිපයාධිකාරයේ ඉසුරුමත් කිරීමට සියල්ල යටත් කරන පද්ධතියක් සමග එකට පැහෙන්නේ නැති බව ය.

මෙම පාඩම ඇමරිකානු කම්කරු පන්තියේ අරගලවල දේශපාලන දිශානතියේ නව ආරම්භය බවට පත් විය යුතු ය. සමාජවාදී ක්‍රියාමාර්ගයක පදනම මත ආර්ථික ජීවිතය යලි සංවිධානය කිරීමට සටන් කරන නව ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් වර්ධනය කිරීම පමනක් බිහිසුනු නිමිත්තක් බවට පත් වූ නිව් ඕලියන්ස්හි ව්‍යසනයෙන් ගොඩ ඒමේ මාවතක් සම්පාදනය කරනු ඇත.

© www.wsws.org